සමුපකාර කාර්යසාධන ඇගයීම - 2026

ඇගයීම් ක්ෂේත්‍ර හා නිර්ණායක සම්පූර්ණ කිරීමට අදාළ උපදෙස් (ප්‍රජා මූලා)

i. මෙම කාර්යසාධන ඇගයීමට අදාළ අයදුම්පත්‍රය www.coop.gov.lk යන වෙබ් අඩවියෙන්, Coop Sri Lanka නිල Facebook ගිණුමෙන් හෝ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවි මඟින් බාගත කළ හැකි ය. (මුද්‍රිත පොතක් නිකුත් කරනු නොලැබේ.)

ii. එසේම එහි මෘදු පිටපත් පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙතින්, සහකාර කොමසාරිස් කාර්යාල වෙතින් සහ සමිතිභාර සංවර්ධන නිලධාරීන් මඟින්ද ලබා ගත හැකිය.

iii. ඇගයුම් වර්ෂය 2025.01.01 සිට 2025.12.31 දක්වා වේ. පෙර වර්ෂය 2024.01.01 සිට 2024.12.31 දක්වා වේ. සමිතියේ මුදල් වර්ෂය කුමක් වුවද, ඉහත පරිදි ඇගයුම් වර්ෂය හා පෙර වර්ෂයේ ගිණුම් ගලපා ගත යුතුය.

iv. සමිතියේ මුළු වත්කම් ගණනය කිරීමේදී ශේෂ පත්‍රයේ ඇතුළත් වත්කම් වලින් ක්‍රියාකාරී වත්කම් පමණක් අදාළ කර ගත යුතුය.

v. ඉලක්කම් සහිත පිළිතුරු ඉදිරිපත් කිරීමේදී ආසන්න දශම ස්ථාන දෙකකට වැටයිය යුතුය.

vi. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඇගයීමට සළකා බලන (2025.01.01 සිට 2025.12.31 දක්වා) කාල සීමාවට අදාළ තොරතුරු පමණක් ඇතුළත් කිරීමට සැළකිලිමත් විය යුතුය. (අත්පොතෙහි 7 කරුණ, අදියර I)

vii. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කරුණු නොමැති නම් එම ස්ථානය හිස්ව තබන්න.

viii. සමුපකාර සමිතියේ කාර්ය මණ්ඩලයක් නොමැති නම්, කාර්ය මණ්ඩලයට අදාළ කරුණු වලදී සමිතියේ ස්වේච්ඡා නිලධාරීන් (භාණ්ඩාගාරික, කාරක සභාව, සාමාජිකයින්...) සුදුසු පරිදි අදාළ කර ගන්න.

ix. අයදුම්පත් යොමු කළ යුත්තේ කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 330 ලිපිනයේ පිහිටි, සමුපකාර සංවර්ධන (රේඛීය) දෙපාර්තමේන්තුව වෙත පමණි. පළාත් හෝ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු නොකළ යුතුය. (ලබා දී ඇති අත්පොතෙහි 6 කරුණ සැළකිල්ලට ගත යුතුය.)

x. viii කරුණෙහි සඳහන් උපදෙස් අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතිය අයදුම්පත සඳහා ලබා ගැනීමෙන් අනතුරුව, එය සමිතිය විසින්ම නියමිත කාලය තුළ පැමිණ භාරදීම හෝ ලියාපදිංචි තැපැලට හෝ සීඝ්‍රගාමී තැපැලට යොමු කළ යුතුය.

1	**නායකත්වය. (ලකුණු 140)**
1.1	**සමුපකාර නායකත්වය. (ලකුණු 90)**
1.1.1	සමිතියේ දැක්ම, මෙහෙවර, වටිනාකම් සහ අරමුණු සඳහන් කරන්න.
1.1.2	(i) අභ්‍යන්තර හා බාහිර පාර්ශව දැනුවත් කර ඇති ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ii) ක්‍රියාමාර්ග සඳහන් කරන්න.
1.1.3	සමුපකාර වටිනාකම් වලට අදාළව සමිතියේ නායකත්වය කටයුතු කර ඇති ආකාරය සඳහන් කරන්න.

1.1.4	සමිතියේ ඵලදායිතාවය වැඩිදියුණු කර ඇති ආකාරය හා ඒ පිළිබඳ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබා ගෙන ඇති ආකාරය සඳහන් කරන්න.
1.1.5	තිරස් හා සිරස් සන්නිවේදනය සිදු වන ආකාරය සඳහන් කරන්න.
1.1.6	වැඩ පහසු කිරීම සඳහා කටයුතු කර ඇති ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.
1.1.7	සහභාගී කර ගෙන ඇති ආකාරය සඳහන් කරන්න.
1.1.8	සමිතියේ මෙහෙයුම් කටයුතු පිළිබඳ ප්‍රතිඵල ලබා ගන්නා ආකාරය සඳහන් කරන්න.
1.1.9	ස්ථානීය පරීක්ෂාවේදී ලකුණු ලබා දෙන බැවින් කරුණු සඳහන් කිරීම අවශ්‍ය නොවේ.
1.1.10	සමිතිය මුහුණ දුන් විවිධ ගැටළුකාරී අවස්ථාවන්හිදී කටයුතු කළ ආකාරයන් හා ඒවා ජය ගැනීමට කටයුතු කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ආපදා තත්ත්ව හැර)
1.1.11	ක්‍රියාමාර්ග සඳහන් කරන්න.
1.1.12	එවැනි අවස්ථා ඇත්නම් සඳහන් කරන්න.
1.2	**සමුපකාර ආයතනික සංස්කෘතිය. (ලකුණු 25)**
1.2.1	හඳුන්වා දී ඇති නවීන තාක්ෂණික ක්‍රම, නිර්මාණශීලී ක්‍රම හා සම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම පිළිබඳ සඳහන් කරන්න.
1.2.2	එවැනි ක්‍රම ඇත්නම් සඳහන් කරන්න.
1.2.3	ඵලදායිතා සංස්කෘතියක් සඳහා විධිමත් සංවිධාන ව්‍යුහයක් ඇත්නම් සඳහන් කරන්න.
1.2.4	ඵලදායිතාව ප්‍රවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සකස් කර ඇති ක්‍රමවේදයන් සඳහන් කරන්න.
1.3	**යහපාලනය සහ සමාජයීය වගකීම්. (ලකුණු 25)**
1.3.1	විගණන විමසුම් ලැබී ඇත්නම් ලැබුණු දිනය හා පිළිතුරු සැපයූ දිනයන් වෙන් වෙන්ව සඳහන් කරන්න. තොරතුරු පනත අනුව කටයුතු කර තිබීම, වත්කම්-බැරකම් ප්‍රකාශ ලබා දීම, ප්‍රසම්පාදන ක්‍රමවේද ආදී කරුණු සඳහන් කරන්න.
1.3.2	අල්ලස හා දූෂණය පිටුදැකීමට සමිතිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහන් කරන්න.
1.3.3	ප්‍රජාව සහභාගී කර ගෙන සිදු කර ඇති ක්‍රියාකාරකම් සඳහන් කරන්න. (සමාජ, සංස්කෘතික හා ආර්ථික ව්‍යාපෘති.)
1.3.4	එසේ කටයුතු කර ඇති ආකාරයන් කරුණු වශයෙන් සඳහන් කරන්න.
2	**සාමාජික සේවාලාභීන්. (ලකුණු 120)**
2.1	**සාමාජික අවශ්‍යතා. (ලකුණු 40)**
2.1.1	සමිතියේ ඇති දත්ත පද්ධතිය හා එයින් සංඛ්‍යාත්මකව තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සඳහන් කරන්න.
2.1.2	සාමාජික සහභාගීත්වය ලබා ගත් අවස්ථා හා සාමාජික ප්‍රවණතා හඳුනා ගෙන ඇති ආකාර සඳහන් කරන්න.
2.1.3	සාමාජික අවශ්‍යතා ඉටු කිරීම සඳහා සමිතිය විසින් සිදු කර ඇති ක්‍රියාමාර්ග සඳහන් කරන්න.
2.1.4	එවැනි ක්‍රමවේද (සම්ප්‍රදායික, නවීන, තාක්ෂණික) පිළිබඳ සඳහන් කරන්න.
2.1.5	ඉහත හඳුනාගත් සාමාජික අවශ්‍යතා ඉටු කිරීමට කෙටි කාලීන, දිගු කාලීන සැලසුම් සකස් කර ඇත්නම් ඒවා සඳහන් කරන්න.
2.2	**සාමාජික සබඳතාව. (ලකුණු 50)**
2.2.1	අනුගමනය කර ඇති ක්‍රමවේද සඳහන් කරන්න.
2.2.2	නිර්මාණශීලී, නවීන, තාක්ෂණික ක්‍රමවේද යොදාගෙන ඇත්නම් සඳහන් කරන්න.

2.2.3	මේ සඳහා සකස් කර ඇති ක්‍රමවේද ඇත්නම් සඳහන් කරන්න.
2.2.4	ඉහත කරුණට අදාළව වැඩිදියුණු කිරීම් කළ අවස්ථා සඳහන් කරන්න.
2.2.5	එවැනි පහසුකම් සලසා ඇති අවස්ථා දක්වන්න. (භාෂා නිපුණතාව)
2.2.6	එවැනි අවස්ථා සඳහන් කරන්න. (භාවිතා කළ නවීන තාක්ෂණික අවස්ථා.)
2.3	**සාමාජික තෘප්තිය. (ලකුණු 30)**
2.3.1	සාමාජික තෘප්තිය මැනීමේ ක්‍රමවේද ඇත්නම් සඳහන් කරන්න.
2.3.2	ඒවා රූප සටහන්, චිත්‍ර මඟින් විශ්ලේෂණය කරන්න.
2.3.3	ඉහත විශ්ලේෂණය අනුව වැඩිදියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.
2.3.4	එවැනි අවස්ථා සඳහන් කරන්න.
3	**සැලසුම්කරණය හා උපායමාර්ග සංවර්ධනය. (ලකුණු 80)**
3.1	**සැලසුම් හා උපායමාර්ග සංවර්ධනය. (ලකුණු 30)**
3.1.1	උපායමාර්ගික සැලැස්මක් සකස් කර ඇත්නම් තිබෙන බව සඳහන් කරන්න. එම උපායමාර්ගික සැලැස්ම සමිතිය අධීක්ෂණයට පැමිණෙන ඇගයුම් මණ්ඩලයට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.
3.1.2	2025 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව ඇත්නම් ඒ බව සඳහන් කර, එය සමිතිය අධීක්ෂණයට පැමිණෙන ඇගයුම් මණ්ඩලයට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.
3.1.3	එය අධීක්ෂණයට පැමිණෙන ඇගයුම් මණ්ඩලයට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය. (අනුගත කරන ලද උපායමාර්ගික සැලැස්ම සමඟ ඉදිරිපත් කළ යුතුය.)
3.1.4	සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු ය.
3.1.5	සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු ය.
3.2	**සැලසුම් ක්‍රියාත්මක කිරීම. (ලකුණු 50)**
3.2.1	සන්නිවේදනය කර ඇති ආකාරය සඳහන් කරන්න.
3.2.2	වගකීම් බෙදා ඇති ආකාරය පිළිබඳ සඳහන් කරන්න.
3.2.3	ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතීන් කාලවකවානු අනුව දක්වන්න. (කාර්තු පදනමින්)
3.2.4	සේවකයන් සඳහා පුද්ගල මට්ටමෙන් කාර්යසාධන නිර්ණායක ඇත්නම් දක්වන්න.
3.2.5	කාර්යසාධනය මැනීම සඳහා යොදා ගෙන ඇති ක්‍රමවේද සඳහන් කරන්න.
3.2.6	කාර්යසාධනය මැනීම මඟින් ප්‍රවණතා හඳුනාගෙන යෙදූ පිළියම් සඳහන් කරන්න.
3.2.7	සංශෝධනය වී ඇත්නම් පමණක් කරුණු දක්වන්න. එසේ සංශෝධනය වී නැත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙනු ලැබේ.
4	**මානව සම්පත. (ලකුණු 160)**
4.1	**මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය. (ලකුණු 50)**
4.1.1	අනුමත පිරිස්බල තක්සේරුව ඉදිරිපත් කරන්න. (2025.12.31 දිනට වලංගු)
4.1.2	ඉහත 4.1.1 හි පිරිස්බල තක්සේරුව අනුව සේවක සංඛ්‍යාව සඳහන් කරන්න.
4.1.3	අදාළ තොරතුරු ඉදිරිපත් කරන්න.
4.1.4	අදාළ තොරතුරු ඉදිරිපත් කරන්න.
4.1.5	අදාළ ලේඛන ඉදිරිපත් කරන්න.
4.1.6	සිදු කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කරන්න.
4.1.7	එවන් ක්‍රමවේදයන් ඇත්නම් සඳහන් කරන්න.

4.2	**කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය සහ සුභසාධනය. (ලකුණු 60)**
4.2.1	එවන් ක්‍රමවේද ඇත්නම් සඳහන් කරන්න.
4.2.2	යොදා ඇති ක්‍රමවේද සඳහන් කරන්න.
4.2.3	ඇගයුම් මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කළ යුතු ය. (මෙහි සඳහන් කිරීම අවශ්‍ය නොවේ.)
4.2.4	අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න.
4.2.5	අදාළ සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කරන්න.
4.2.6	අදාළ සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කරන්න.
4.2.7	එවන් යාන්ත්‍රණයක් ඇත්නම් සඳහන් කරන්න.
4.3	**කාර්ය මණ්ඩල කාර්යසාධනය හා ඇගයීම. (ලකුණු 50)**
4.3.1	ඇගයුම් කිරීමට පැමිණෙන අවස්ථාවේදී අදාළ තොරතුරු ගොනුවක් සකස් කර ඉදිරිපත් කරන්න.
4.3.2	සකස් කර ඇති ක්‍රමවේදයන් ඇත්නම් සඳහන් කරන්න.
4.3.3	2025 වර්ෂයට අදාළ වැටුප් වර්ධක ලබා දුන් නිලධාරීන්ගේ නම හා වැටුප් වර්ධකය ලබා දුන් දිනය ලේඛනයකින් දක්වන්න.
4.3.4	එලෙස දිරිදීමනා ක්‍රමවේදයක් ඇත්නම් තොරතුරු සඳහන් කරන්න.
4.3.5	2024 හෝ 2025 යන වර්ෂ දෙකෙන් එක් වර්ෂයකදී විගණනය අවසන් කර, ලාභ විසර්ජනය කිරීමේ තහවුරුව ඉදිරිපත් කරන්න.
4.3.6	එලෙස ඇති ක්‍රමවේද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
5	**ක්‍රියාවලි හා දැනුම කළමනාකරණය. (ලකුණු 150)**
5.1	**ක්‍රියාවලි කළමනාකරණය. (ලකුණු 40)**
5.1.1	සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබේ නම් එම තොරතුරු ඉදිරිපත් කරන්න. (ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒ යටතේ සහායක ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් දක්වන්න.)
5.1.2	අධීක්ෂණ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.
5.1.3	මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය සම්පත් කළමනාකරණයට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
5.1.4	සමිතිය විසින් තොරතුරු පද්ධති යොදා ගෙන ඇති ආකාරයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
5.2	**නව්‍යකරණය. (ලකුණු 40)**
5.2.1	අදාළ විස්තර ඉදිරිපත් කරන්න.
5.2.2	යෝජනා ලබා ගත් ක්‍රමවේදය හා එහි ප්‍රගතිය දක්වන්න.
5.2.3	අඛණ්ඩ වැඩි දියුණු කිරීම් සිදු කිරීමට අදාළ (KAIZEN ආකෘතිය අනුව) යෝජනා දක්වන්න.
5.2.4	ඇගයුම් ක්‍රමවේදය දක්වන්න.
5.2.5	ඩිජිටල්කරණය භාවිතා කළ අවස්ථා හා ප්‍රතිඵල දක්වන්න.
5.2.6	පර්යේෂණ ඒකකය පිළිබඳ කරුණු දක්වන්න.
5.3	**සැපයුම් කළමනාකරණය. (ලකුණු 25)**
5.3.1	පාලන ක්‍රමවේද සඳහන් කරන්න, අධීක්ෂණ මණ්ඩලයට තොරතුරු සනාථ කළ යුතු ය.
5.3.2	එවැනි අවස්ථා සඳහන් කරන්න.
5.3.3	ක්‍රියාමාර්ග ගැනීමට අදාළ ක්‍රමවේද සඳහන් කරන්න.

5.4	**දැනුම කළමනාකරණය.**	**(ලකුණු 20)**
5.4.1	කාර්ය මණ්ඩලය සතු දැනුම හා හැකියාවන් හඳුනා ගැනීම සහ එයින් ප්‍රයෝජනයට ගත් අවස්ථාවන් සඳහන් කරන්න.	
5.4.2	එවැනි තොරතුරු පද්ධතියක් පවතී නම් සඳහන් කරන්න. එයින් ප්‍රයෝජනයට ගත් අවස්ථාවන් සඳහන් කරන්න.	
5.4.3	කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා ලද දැනුම හුවමාරු කිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධ තොරතුරු සපයන්න.	
5.5	**ක්‍රියාවලි කළමනාකරණය සඳහා දත්ත, තොරතුරු හා දැනුම භාවිතය.**	**(ලකුණු 25)**
5.5.1	එලෙස කටයුතු කළ ආකාරය විස්තර කරන්න.	
5.5.2	ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේද විස්තර කරන්න, එම තොරතුරු අධීක්ෂණයේදී තහවුරු කළ යුතු වේ.	
5.5.3	යොදා ගෙන ඇති ආරක්ෂිත ක්‍රමවේද සඳහන් කරන්න.	
5.5.4	එවැනි හුවමාරු ක්‍රියාවලීන් හා ක්‍රමවේද සඳහන් කරන්න.	
6	**ප්‍රතිඵල.**	**(ලකුණු 350)**
6.1	**ආයතනික ප්‍රතිඵල.**	**(ලකුණු 270)**
6.1.1	**සාමාජික ප්‍රතිඵල.**	**(ලකුණු 75)**
6.1.1.1	වගු අංක 1ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.1.2	වගු අංක 2ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.2	**මූල්‍ය ප්‍රතිඵල.**	**(ලකුණු 95)**
6.1.2.1	වගු අංක 3ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.2.2	වගු අංක 4ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.3	**කළමනාකරණ මණ්ඩල තීරණ ප්‍රතිඵල.**	**(ලකුණු 20)**
6.1.3.1	වගු අංක 5ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.3.2	වගු අංක 6ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.3.3	වගු අංක 7ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.4	**කාර්ය මණ්ඩල තීරණ ප්‍රතිඵල.**	**(ලකුණු 20)**
6.1.4.1	වගු අංක 8ට අදාළව ගණනය කිරීම් කළ යුතු ය. (මුදල් වර්ෂය කෙසේ වුවද, 2025.01.01 සිට 2025.12.31 දක්වා ගිණුම් භාවිතා කළ යුතුය.)	
6.1.4.2	ප්‍රතිඵල හා සාධනීය ප්‍රවණතා සඳහන් කරන්න, ඉහත නිර්ණායකයන්වල දක්වා ඇති ආයතනික සන්නිවේදන අවස්ථා වැඩිදියුණු කිරීමට අදාල ප්‍රතිඵල දක්වන්න. අධීක්ෂණයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.	
6.1.4.3	මානව සම්පත නිර්ණායකය යටතේ දක්වා ඇති පුහුණු වැඩසටහන්වල ප්‍රතිඵල, වර්තමාන තත්ත්වය හා ප්‍රවණතා සඳහන් කරන්න. (පෙර හා පසු තත්ත්වයන්)	
6.1.4.4	කාර්ය මණ්ඩල කාර්යසාධනය හා ඇගයීම (4.3) යටතේ දක්වා ඇති කරුණු වලට අදාළ වර්තමාන තත්ත්වය හා සාධනීය ප්‍රවණතා දැක්විය යුතු ය.	

6.1.5	**ක්‍රියාවලි ප්‍රතිඵල. (ලකුණු 40)**
6.1.5.1	ඉහත නිර්ණායකයන්හි දක්වා ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වැඩිදියුණු කිරීම්වල වර්තමාන තත්ත්වය හා සාධනීය ප්‍රවණතා දක්වන්න. (පෙර හා පසු තත්ත්වයන්)
6.1.5.2	ඉහත නිර්ණායකයන්හි දක්වා ඇති කළමනාකරණ කටයුතුවල වර්තමාන තත්ත්වය හා සාධනීය ප්‍රවණතා දක්වන්න.
6.1.5.3	ඉහත නිර්ණායකවල දක්වා ඇති සරල කරන ලද ක්‍රියාවලීන්වල වර්තමාන තත්ත්වය හා සාධනීය ප්‍රවණතා සඳහන් කරන්න.
6.1.5.4	ඉහත සැලසුම්කරණ හා උපායමාර්ග සංවර්ධනය නිර්ණායකය යටතේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ඉලක්කයන් හා එහි සාධනීය ප්‍රවණතා සඳහන් කරන්න.
6.1.6	**ආයතනික ජයග්‍රහණ. (ලකුණු 20)**
6.1.6.1	2020 සිට 2025.12.31 දක්වා ලබා ගෙන ඇති ආයතනික සම්මාන සඳහන් කරන්න. (ජාතික, පළාත්, දිස්ත්‍රික් මට්ටමින් සමිතිය විසින් ලබා ගත්.)
6.1.6.2	සමිතිය නියෝජනය කරමින් ලබා ගත් පුද්ගල සම්මාන සඳහන් කරන්න.
6.2	**සමිතියේ අභිවෘද්ධිය උදෙසා ප්‍රතිඵලදායක නව්‍යකරණ ව්‍යාපෘති. (ලකුණු 80)**
6.2.1	ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති අතරින් වඩාත් ප්‍රතිඵලදායක මෙහෙයුම් ව්‍යාපෘති දෙකක් (02) සඳහන් කරන්න. (ලබා දී ඇති ආකෘතියට අනුව.)
6.2.2	එවැනි සමාජ සත්කාරක ව්‍යාපෘති දෙකක් (02) සඳහන් කරන්න.